

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT
2021

லෝහෝර් ආර්යා ණය අරමුදල - මුදල් අමාත්‍යාංශය

லோஹோர் சீமாட்டி கடன் நிதியம் - நிதி அமைச்சு

Lady Lochore Loan Fund - Ministry of Finance



වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT
2021

ලෝහෝර් ආර්යා ණය අරමුදල - මුදල් අමාත්‍යාංශය

லோஹோர் சீமாட்டி கடன் நிதியம் - நிதி அமைச்சு

Lady Lochore Loan Fund - Ministry of Finance

පටුන

සංස්ථාපිත තොරතුරු 01

සභාපතිතුමාගේ පණිවිඩය 02

පාලන භාරකාරතුමාගේ පණිවිඩය 03

1. අරමුදලේ පසුබිම 04

1.1 භාරකාර මණ්ඩලය 04
- 2021 වසරේ අරමුදලේ කාර්යය මණ්ඩලය 05

1.2 සංවිධාන ව්‍යුහය 05

2. **2021 වසරේ අරමුදලෙහි කාර්යසාධනය**

2.1 2021 වසරේ ප්‍රතිලාභීන් 06-09
2.2 ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රගතිය 10-11
2.3 නිකුත් කල ණය සීමාවන් හා ණය මුදල් වටිනාකම 11
2.4 ණය අයකර ගැනීමේ ප්‍රගතිය 11-12
2.5 කාර්යාල සංකීර්ණය - ලෝහෝර් ආර්යා ණය අරමුදල 12
2.5.1 කුලී ආදායම 12
2.5.2 අරමුදලෙහි තිරසාරභාවය 13
2.5.3 මෙහෙයුම් ආදායම 13

3. **සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය**

3.1 සේවක අභිප්‍රේරණය ඉහළ නැංවීම **(කාර්ය මණ්ඩල පුහුණුව - 2021)** 14
3.2 අරමුදලේ බඳවා ගැනීමේ සහ උසස්වීම් පරිපාටින් 14
- නව බඳවා ගැනීම් 14

3.3 අරමුදල් පරිශ්‍රය නවීකරණය කිරීම 15
3.4 කාර්යාලීය ක්‍රමවේදයන් විධිමත් කිරීම/අරමුදලේ සංවත්සර සැමරුම 15-16
3.5 කාර්ය මණ්ඩල ණය 17
3.6 ඉඩම් ඔප්පු සහ බැදුම්කර 17
3.7 රැස්වීම් 17
3.8 විගණන හා කළමණාකරණ කමිටුව 17

4. **අනාගත සැලසුම්** 18
5. **ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව** 19
6. **ආදායම් ප්‍රකාශනය** 20
7. **මූල්‍ය තත්ව ප්‍රකාශනය** 21
8. **ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශය** 22
9. **මුදල් ප්‍රවාහ ප්‍රකාශනය** 23
10. **ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති**
- පොදු 24
- වත්කම් සහ එහි වටිනාකම් තක්සේරු කිරීමේ පදනම 24
- වගකීම් සහ ප්‍රතිපාදන 25
- ආදායම් ප්‍රකාශනය 26

11. **මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්** 27-32

ලෝහෝර් ආර්යා ණය අරමුදල

දැක්ම

රාජ්‍ය හා රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවකයින් සහ
ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා මූල්‍ය පහසුකම්
සලසා දෙනු ලබන ප්‍රමුඛ ආයතනයක් ලෙස ක්‍රියා කිරීම.

මෙහෙවර

රාජ්‍ය හා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවකයින් සහ
ත්‍රිවිධ හමුදා සාමාජිකයින් ණය බරින් මුදවා යහපත් මානසික
පරිසරයකින් යුත්
රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම සඳහා දායකවීම.

අරමුණ

රාජ්‍ය හා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවකයින් හා
ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා සහනශීලී පොලී අනුපාතයක් හා
පහසු කොන්දේසි මත
කෙටි කාලීන ණය මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම මඟින්
ඔවුන්ව ණය බරින් මුදවා ගැනීම.

කාර්ය භාරය

- ණය අරමුදල තිරසාරව පවත්වා ගනිමින් සේවා ලාභීන් සඳහා ණය පහසුකම් සැපයීම.
- ආයතනික ප්‍රවර්ධනය සහ එයට සාපේක්ෂව ධාරිතාවය වැඩි කිරීම.
- අරමුදල් සම්පාදනය කර ගනිමින් ආයතනය පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියා පටිපාටින් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- ණය කළමනාකරණය සඳහා යෝග්‍ය වන ක්‍රමෝපායන් දියුණු කිරීම සහ ණය දීමේ පහසුකම් කාර්යක්ෂමව කිරීම සහ වැඩි දියුණු කිරීම.
- අනිකුත් රාජ්‍ය ආයතන වල සේවකයින් සඳහා වූ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දී පහසු කාරකයෙකු වශයෙන් කටයුතු කිරීම.
- ණය ලබා දීමේ දී හා කටයුතු පවත්වාගෙන යාමේදී විධිමත් මූල්‍ය පාලන ක්‍රමවේදයක් ඇතිව කටයුතු කිරීම.

සංස්ථාපිත තොරතුරු

ආයතනයේ නම ලිපිනය :

- **ලෝහෝර් ආර්යා ණය අරමුදල**
- 100 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

සංස්ථාපිත කිරීම :

- 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල භාරකාර මණ්ඩල පනත (1953 සංශෝධිත) යටතේ ස්ථාපිත මුදල් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත ආයතනයකි.

භාරකාර මණ්ඩලය :

➢ ඒ. පී. කුරුම්බලපිටිය මහතා	-	සභාපති (අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුව),මුදල් අමාත්‍යාංශය.
➢ කමලා රණතුංග මැතිණිය	-	පාලන භාරකාර, ලෝහෝර් ආර්යා ණය අරමුදල
➢ තුෂාර සෙනෙවිරත්න මහතා	-	භාරකාර
➢ ප්‍රදීප් නිරෝෂන් වීරසිංහ මහතා	-	භාරකාර
➢ ඒ.එස්.පී.එස්.පී.සංජීව මහතා	-	භාරකාර

විගණන කමිටුව :

➢ කේ.එම්.බී.පී.වීරසිංහ මැතිණිය	-	සභාපති, (ප්‍රධාන ගණකාධිකාරී, මුදල් අමාත්‍යාංශය)
➢ තුෂාර සෙනෙවිරත්න මහතා	-	සාමාජික (භාරකාර, ලෝහෝර් ආර්යා ණය අරමුදල)
➢ ඒ.එස්.පී.එස්.පී.සංජීව මහතා	-	සාමාජික (භාරකාර, ලෝහෝර් ආර්යා ණය අරමුදල)

විගණක: පෝප් සහ සමාගම,
වරලත් ගණකාධිකාරී,
07, හඩ්සන් පාර,
කොළඹ 03.

නිල බැංකුකරු: මහජන බැංකුව,
මූලස්ථාන ශාඛාව,
කොළඹ 02.

සභාපතිතුමාගේ පණිවුඩය

වර්තමානයේ රට මුහුණ දී ඇති ආර්ථික, සමාජීය, දේශපාලන හා සංස්කෘතික තත්වයන් මත 1927 මාර්තු 26 දින ස්කොට්ලන්ත ජාතික ජින් ලෝහෝර් ආර්යාවගේ මූලික ධන පරිත්‍යාගයෙන් පිහිටුවන ලද ලෝහෝර් ආර්යා ණය අරමුදලේ අවශ්‍යතාවය වඩාත් ඉස්මතුව ඇත. විශේෂයෙන් බැංකු ක්‍රමයෙන් හා අවිධිමත් පෞද්ගලික අංශයෙන් ණය ලබාගැනීමේදී පවතින දැඩි කොන්දේසි සහ අධික පොලී අනුපාත මත රාජ්‍ය නිළධාරීන් දැඩි අසීරුතාවයට පත්ව ඇත.

ඒ අනුව පසුගිය වසර කිහිපය සලකා බැලීමේදී රාජ්‍ය නිළධාරීන් වැඩිවැඩියෙන් අරමුදලින් සහනදායී කොන්දේසි මත අඩු පිරිවැයක් සහිත ණය ලබාගැනීමට පෙළඹී ඇති බව පසුගිය සංඛ්‍යා ලේඛණ පරීක්ෂා කිරීමේදී පෙනී ගොස් ඇත.

එහෙත් වර්තමානයේ අරමුදල සතු මුදල් ද්‍රවනතාවය රාජ්‍ය අංශයේ නිළධාරීන් හට ණය ලබාදීමට අහිතකර ලෙස බලපා ඇත. ඒ අනුව ඉදිරියේදී අරමුදල සතු ප්‍රාග්ධන මුදල වැඩිකරගැනීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග වලට යොමුවීම අරමුදලේ අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීම සඳහා අත්‍යාවශ්‍ය කරුණක් වී ඇත.

විශේෂයෙන් 2021 වර්ෂයේ කාර්යසාධනය පිළිබඳ විමර්ශනයක් කිරීමේදී පෙර වර්ෂයට සාපේක්ෂව ආදායමේ අඩුවීමක් පෙන්නුම් කරන අතරම ඊට සාපේක්ෂව වියදමෙහි වැඩිවීමක් පෙන්නුම් කරයි. විශේෂයෙන් රටතුළ පැවති වසංගත තත්වය හා රටේ ආර්ථිකයේ සිදුවූ සෘණාත්මක වර්ධනය මුළු ආර්ථික ක්‍රියාවලියටම අහිතකර ලෙස බලපෑ බැවින් අරමුදලක් ලෙස ආර්ථිකයේ සිදුවන උච්චාවචනයන් එහි කාර්යසාධනයට සෘජුව බලපායි. ඒ අනුව 2021 වර්ෂයේ බදු පසු ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව 27% පමණ අඩුවී ඇත. ඒ අනුව 2021 වර්ෂයේ සිදුවූ එම පසුබෑම අරමුදලේ මූල්‍ය ස්ථාවරත්වයට අහිතකර ලෙස බලපෑවද , සෘණාත්මක ආර්ථික තත්වයන් තුළ ආයතනයේ කාර්යසාධනය ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යාමට පසුගිය වසරේ ලබාගත් අත්දැකීම් ඉමහත් පිටුවහලක් ලෙස සලකමි. පසුගිය වසරේ කාර්යසාධනය පරීක්ෂා කිරීමේදී පෙර වර්ෂය හා සැසඳීමේදී ණය ලබාදීම් 37% පමණ අඩුවී ඇති අතර අතිරික්ත අරමුදල් විශාල වශයෙන් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඇත. පෙර වර්ෂය හා සැසඳීමේදී ස්ථාවර තැන්පතු වටිනාකම 68% පමණ වැඩි වී ඇත. අරමුදලේ අරමුණු හා අනුගතවීමේදී මෙම තත්වය සාධාරණීකරණය කළ නොහැකි නමුත් පැවති ආර්ථික තත්වය උඩ ප්‍රමාණාත්මක වශයෙන් ණය ලබාදීම් අඩුවී ඇත. නමුත් ආර්ථිකය යථා තත්වයට පත්වීමේදී මෙම තත්වය මඟහැරෙනු ඇත.

මහා භාණ්ඩාගාරයට බරක් නොවී ස්වාධීනව තම මෙහෙයුම් කටයුතු සිදුකරන මෙම අරමුදලේ කාර්යසාධනය වඩාත් විනිවිද භාවයකින් පවත්වාගෙන යෑම අත්‍යාවශ්‍ය කාර්යයක් වන බැවින් ස්වාධීන විගණනයක් සිදුකිරීම අරමුදලේ ඉදිරි පැවැත්ම සඳහා වඩාත් වැදගත් වේ. ඒ අනුව අරමුදලේ විගණන කටයුතු රජයේ විගණකාධිපති මගින් සිදුකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගෙන ඇති අතර, ඒ අනුව ඉදිරියේදී විගණකාධිපති විසින් අරමුදලේ විගණන කටයුතු සිදුකරගෙන යනු ඇත.

අවසාන වශයෙන් 2021 වර්ෂයේ අරමුදලේ කාර්යයන් ඉටුකිරීමේදී පාලක මණ්ඩලය විසින් මා වෙත ලබාදුන් දායකත්වය පිළිබඳ මාගේ අවංක ස්තුතිය ඔවුන් වෙත පුදකරන අතර කවදත් අරමුදලේ ප්‍රගතිය වෙනුවෙන් විශාල කාර්යභාරයක් සිදුකරන අරමුදලේ කාර්ය මණ්ඩලයටට ද මාගේ ස්තුතිය පුදකරන අතර අරමුදලේ ඉදිරි ක්‍රියාකාරිත්වය සඳහා ඔවුන්ගේ ධනාත්මක සහයෝගය තවදුරටත් අපේක්ෂා කරමි.

ඒ.පී. කුරුම්බලපිටිය
සභාපති
ලෝහෝර් ආර්යා ණය අරමුදල.

පාලන භාරකාරතුමිගේ පණිවුඩය

වසර 94 ක ඉතිහාසයක් ඇති ලෝහෝර් ආර්යා ණය අරමුදලේ නිර්මාතෘ තුමිය වන ජින් ලෝහෝර් ආර්යාවගේ අරමුදල ස්ථාපිත කිරීමේ අරමුණු උපරිම ආකාරයෙන් 2021 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද නමුත් ගෝලීය ආර්ථිකයට දැඩි බලපෑමක් එල්ල කරන ලද කොරෝනා වසංගත තත්ත්වය හමුවේ නව වසර වෙනුවෙන් සැලසුම් කල පරිදි අරමුදලේ ණය නිකුත් කිරීමේ කාර්යභාරය සම්පූර්ණ කරගැනීමට නොහැකි විය.විශේෂයෙන් මෙම වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වර්ෂයේ කාර්යාලය විවෘත කිරීමට නියමිතව තිබූ කාර්යාලීය දින 239 ක ප්‍රමාණයෙන් කාර්යාලය සම්පූර්ණයෙන් මෙහෙයුම් කටයුතු සඳහා දින 110 ක් විවෘත කර ඇති අතර දින 38 ක් කාර්යාලය සම්පූර්ණයෙන්ම වසා දැමීමට සිදු විය. මෙහි කාර්ය මණ්ඩලය අඩ වශයෙන් සේවයට කැඳවා තවත් දින 91 ක් කාර්යාලය විවෘත කල අතර, මෙහි කාර්ය මණ්ඩල සාමාජිකයන් ද කොරෝනා වසංගත රෝගී තත්ත්වයට ගොදුරු විය.

මෙවැනි පසුබිමක් තුල අරමුදලේ ප්‍රධාන මෙහෙයුම් කටයුත්ත වූ ණය නිකුත් කිරීම සහ අයකර ගැනීම ක්‍රියාවට නැංවීම සිදු වූ බැවින් මෙම වර්ෂයේ දී රාජ්‍ය සේවකයන් 901 දෙනෙකු සඳහා පමණක් රු.මිලියන 136.7 ක ණය වටිනාකමක් ප්‍රදානය කිරීමට හැකි වී ඇත. රු මිලියන 341.6 ක අවකරණ වටිනාකමක් අයකර ගැනීමට සමත් වී ඇති නමුත් මෙම සංඛ්‍යා පෙර වර්ෂවල සංඛ්‍යා සමඟ සංසන්දනය කිරීමේ දී යම් පසුබෑමකට ලක් වී ඇති බව ද එය මෙම ආයතනයේ අකාර්යක්ෂමතාවයක් හේතුවෙන් සිදු වූවක් නොවන බව ද ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ කෘතිම තත්ත්වයක් බව ද සඳහන් කරමි.

මෙවැනි පසුබිමක් තුල වුවද රු.මිලියන 98.9 ක මෙහෙයුම් ආදායමක් ඉපයීමට ද රු.මිලියන 50.4 ක මෙහෙයුම් වියදමක් දැරීමෙන් පසුව රු.මිලියන 48.5 ක බදු පෙර ශුද්ධ ලාභයක් උපයමින් රු.මිලියන 9.7 ක බදු මුදලක් රජයට උපයා දී රු.මිලියන 38.8 ක් වූ බදු පසු ශුද්ධ ලාභයක් ඉපයීමට අරමුදල සමත් වී ඇත.

මෙතරම් අභියෝගයක් හමුවේ වුවද ලබා ඇති මෙම සාර්ථකත්වයට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ලබාදෙමින් මෙහි භාරකාර මණ්ඩලයත් සියළු මහපෙන්වීම් සිදුකරන මුදල් අමාත්‍යාංශයත් මෙහෙයුම් කටයුතු සිදුකරන අරමුදලේ කාර්යය මණ්ඩලයත් මෙම අභියෝග හමුවේ ලබා ඇති මෙකී සාර්ථකත්වයේ නියමුවන් සේ හැඳින්විය හැක.

මෙහි සේවාව වඩාත් පුළුල්ව අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන අතර අරමුදලේ නිර්මාතෘ තුමියගේ අභිමතාර්ථවලට අනුගතව තවදුරටත් මෙහි කාර්යභාරය පුළුල් කිරීමට ආයතනයේ භාරකාර මණ්ඩලයට හා කාර්යය මණ්ඩලයට ශක්තිය ධෛර්ය හා වාසනාව ලැබේවා යි ප්‍රාර්ථනා කරමි.



කමලා රණතුංග
පාලන භාරකාර
ලෝහෝර් ආර්යා ණය අරමුදල

01

අරමුදලේ පසුබිම

ශ්‍රී ලංකාවේ කලක් වාසය කල ස්කොට්ලන්ත ජාතික ජීන් ලෝහෝර් ආර්යාව විසින් ණය අරමුදලක් පිහිටුවීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය සඳහා පවුම් 300 ක මුදලක් පරිත්‍යාග කර තිබිණි. එවකට පුණ්‍ය කොමසාරිස්ව සිටි සී.ඊ.වී.නැතනියල්ස් පියතුමා අරමුදල පිහිටුවීමේ කාර්යයෙහි මූලිකව කටයුතු කර ඇති අතර එය 1927 මාර්තු 26 වන දින ලෝහෝර් ආර්යා ණය අරමුදල නමින් ආරම්භ කරන ලදී. එමෙන්ම අරමුදල 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනත මගින් ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත් විය.

එදා සිට මෙම අරමුදල ප්‍රතිලාභීන් වෙත ණය ප්‍රදානය කරමින් සහ එම ණය ආපසු අයකර ගනිමින් වක්‍රිය අරමුදලක් ලෙසින් ක්‍රියාත්මක වෙමින් පවතී. රාජ්‍ය අංශයේ මෙන්ම වෙළඳ සමාගම්වල සේවය කරන සේවකයින්ටද තමන්ගේ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සපුරා ගැනීමට එවකට පැවති බැංකු ක්‍රමයෙන් පිටිවහලක් නොලැබුන හෙයින් ඔවුන් අධික පොළියට ණය සපයන පුද්ගලයන්ගෙන් ණය ලබා ගැනීමට පුරුදු වී සිටියහ. මේ පසුබිම තුල රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවකයින්ද ණය බරින් පීඩනයට පත්විය. මෙවැනි පරිසරයක් තුල ලෝහෝර් ආර්යා ණය අරමුදල පිහිටුවීමෙන් පසු මෙම සේවකයින්ට ණය ලබා ගැනීමේදී ඉමහත් සහනයක් සැලසුනි. 1951 මෙම පනත ව්‍යවස්ථාගත වීමත් සමගම අරමුදලට රජයෙන් මෙන්ම වෙනත් පරිත්‍යාගශීලීන්ගෙන් ද ලැබුන ආධාර උපයෝගි කරගෙන මෙම ආයතනයටම අයත් තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ඇත.



ජීන් ලෝහෝර් ආර්යාව

1.1. භාරකාර මණ්ඩලය




භාරකාර මණ්ඩලය ගරු මුදල් ඇමතිතුමා විසින් පත් කරනු ලබන රාජ්‍ය අංශයේ සහ සුදුසුකම්ලත් පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ. මෙම ආයතනයෙහි අනුශාසක ධුරය මුදල් අමාත්‍යතුමා විසින් හොබවනු ලබයි. අරමුදලෙහි පරිපාලන කටයුතු සඳහා පාලන භාරකරුවකු ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනතේ 10 වන හා 11 වන වගන්ති ප්‍රකාරව භාරකාර මණ්ඩලය සඳහා පත් වූ අය අතරින් කෙනෙකු පත්කරනු ලැබේ. එම පනතෙහි 5 වන වගන්තියට අනුව භාරකාර මණ්ඩලයෙහි සභාපති තනතුර භාණ්ඩාගාර නියෝජිතවරයා වෙත පවරා ඇත.

වගුව 01 – 2021 වසරේ අරමුදලේ කාර්යය මණ්ඩලය

අනුමත තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව	සේවයේ නියුතු සංඛ්‍යාව
ගණකාධිකාරී	01	01
පරිපාලන නිලධාරී	01	01
ගිණුම් නිලධාරී	01	01
අභ්‍යන්තර විගණක නිලධාරී	01	01
ණය අයකර ගැනීමේ නිලධාරී	01	01
තොරතුරු තාක්ෂණ නිලධාරී	01	-
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන ශ්‍රේණිය)(ලේඛනාගාර සහකාර ඇතුළු)	34 (35)	30
ගොඩනැගිලි අධීක්ෂක (කළමනාකරණ සහකාර - තාක්ෂණික ශ්‍රේණිය)	01	-
කාර්යාල කාර්ය සහායක (ප්‍රාථමික ශිල්පීය නොවන)(නිල බංගලා භාරකරු ඇතුළුව)	07	06
ගොඩනැගිලි නඩත්තු සහායක (ප්‍රාථමික අර්ධ ශිල්පීය)	01	01
රියදුරු (ප්‍රාථමික ශිල්පීය)	02	02
එකතුව	**51**	**44**

1.2 සංවිධාන ව්‍යූහය



02

2021 වසරේ අරමුදලෙහි කාර්යසාධනය


2.1 2021 වසරේ ප්‍රතිලාභීන්

2021 වසරේදී රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු සේවකයින් 901 ක් මෙම අරමුදලේ ප්‍රතිලාභීන් වී ඇත. එම ප්‍රතිලාභීන් පදිංචි දිස්ත්‍රික්කය අනුව දෙවන වගුවෙහි වර්ගීකරණය කර ඇති අතර ගෝලීය වසංගත තත්වය හේතුවෙන් රට වසා දැමීමත් ,විවිධ සීමා පැනවීමත්,බැංකු පොළී අනුපාතිකය රජය විසින් පහත හෙලීමත් හේතුවෙන් 2021 වර්ෂයේදී පෙර වසරට සාපේක්ෂව ණය ප්‍රමාණයේ 52% කින් අඩු වීමක් පෙන්නුම් කරන ලදී. ප්‍රතිලාභීන්ගෙන් 75% අධික පිරිසක් ආරක්ෂක අංශයේ නියුතු පුද්ගලයින් වන බව පහත වගුවෙන් නිරූපනය වේ.

වගුව 02 – 2020/2021 වර්ෂවල ණයලබා ගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව

ප්‍රතිලාභීන් සංඛ්‍යාව				
දිස්ත්‍රික්කය	2021	(%)	2020	(%)
කොළඹ	210	23.31	321	18.50
ගම්පහ	197	21.86	243	14.01
අනුරාධපුරය	39	4.33	88	5.07
මහනුවර	43	4.77	98	5.65
වවුනියාව	0	-	3	0.17
කළුතර	108	11.99	168	9.68
රත්නපුර	27	3.00	67	3.86
ගාල්ල	53	5.88	90	5.19
කුරුණෑගල	60	6.66	189	10.89
පුත්තලම	8	0.89	24	1.38
යාපනය	0	-	0	-
පොළොන්නරුව	12	1.33	32	1.84
ත්‍රිකුණාමලය	11	1.22	9	0.52
මුලතිව්	0	-	0	-
බදුල්ල	17	1.89	53	3.05
මාතලේ	9	1.00	42	2.42
හම්බන්තොට	18	2.00	38	2.19
කෑගල්ල	39	4.33	93	5.36
මඩකලපුව	2	0.22	1	0.06
අම්පාර	12	1.33	42	2.42
මොනරාගල	12	1.33	46	2.65
නුවරඑළිය	5	0.55	33	1.90
මන්නාරම	0	-	0	-
මාතර	19	2.11	55	3.17
එකතුව	**901**	**100**	**1735**	**100**

ප්‍රස්තාරය 01 - 2020/2021 වර්ෂවල ණය ලබා ගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව



වගුව **03 - 2020** හා **2021** වර්ෂවල රාජ්‍ය සේවා ප්‍රතිලාභීන් තනතුරු අනුව

තනතුර	2021	2020
කෝප්‍රල්	115	428
හමුදා සෙබල	18	142
හමුදා සැරයන්	25	63
මේජර්	13	21
ලුතිනන්	5	11
බ්‍රිගේඩියර්	0	1
අරක්කැමි	7	7
භෝජනාගාර සේවක	4	2
පොලිස් කොස්තාපල්	154	314
පොලිස් සැරයන්	152	181
පොලිස් පරීක්ෂක	5	15
ප්‍රධාන පොලිස් පරීක්ෂක	9	16
උප පොලිස් පරීක්ෂක	12	28
පොලිස් ආරක්ෂක සහායක	0	0
පොලිස් සිවිල් සහායක	0	0
ගිනිහටයන්	5	3
රියදුරු	52	38
රිය සහායක	2	0
බන්ධනාගාර නියාමක	1	11
මැනුම් සහායක	0	6
සෞඛ්‍ය පරිපාලක	0	0
උපස්ථායක	0	0
සාමාන්‍ය කම්කරු	80	108
කාර්යාල කාර්යය සහායක	94	121
කළමනාකරණ සහකාර	42	76
සංවර්ධන සහකාර	19	12
ආයුර්වේද වෛද්‍ය සහායක	0	0
ඖෂධවේදී	1	0
මුරකරු	9	3
ආරක්ෂක නියාමක	1	0
මෝටර් කාර්මික	0	2
කාර්මික ශිල්පි	0	2
වඩු කාර්මික නිලධාරී	0	2
මානව සම්පත් සහකාර	0	0
පරිපාලන නිලධාරී	0	1
පෙදරේරු	0	0
ගණකාධිකාරී	3	6
ගබඩා සහායක	3	0

විදුලි කාර්මික	0	0
ඕවර්සියර්	0	2
සහකාර අධ්‍යක්ෂක	2	4
සහකාර ලේකම්	2	0
පුනරුත්ථාපන නිලධාරී	0	0
සිතාසිකරු	1	1
කාලගුණ විද්‍යා නිලධාරී	0	0
පිලිගැනීමේ නිළධාරී	0	0
පොත් බැඳුම්කරු	0	1
ග්‍රාම නිලධාරී	1	0
වැඩසටහන් සහකාර	0	0
කොමිෂන් නොලත් නිලධාරී	17	21
ගිණුම් නිලධාරී	1	0
මැනුම් ක්ෂේත්‍ර සහායක	0	0
රසායනාගාර සහායක	0	0
කර්මාන්ත පරිපාලක	2	0
හෙද නිලධාරී	0	0
කපිතාන්	4	30
අස්ගොව්	1	3
අත් උදව්කරු	0	1
කෘෂිකර්ම උපදේශක	0	0
පින්තාරුකරු	0	0
තාක්ෂණ නිලධාරී	5	1
තැපැල්කරු	0	1
තැපැල් නිලධාරී	0	4
රෙජිස්තාර්	0	0
කර්නල්	1	3
පෙර පාසල් ගුරු	0	0
කොමසාරිස්	0	2
පුස්තකාලයාධිපති	0	0
පුස්තකාල සහායක	1	2
ලේත් මැෂින් ක්‍රියාකරු	2	3
ලෝහ පෑස්සුම්කරු	0	4
වනජීවී ආරක්ෂක නිලධාරී	2	3
වෙනත්	**28**	29
එකතුව	**901**	**1735**

2.2 2021 ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රගතිය


පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයෙකුට මෙම අරමුදලෙන් ණය අයදුම් කළ හැක.

- විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු වසර 3 ක අවම ස්ථිර සේවා කාලයක් හිමි රාජ්‍ය සේවකයකු වීම.
- අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් වසර 5 ක අවම ස්ථිර සේවා කාලයක් සපුරා තිබීම.
- ලබා දෙනු ලබන ණය මුදල් සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට තරම් ප්‍රමාණවත් සේවා කාලයක් තිබීම. (විශ්‍රාම ගන්නා වයස් සීමාව අවුරුදු 59 ලෙස සලකයි)
- අයදුම්කරු සඳහා ඉහත සුදුසුකම් සහිත ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කිරීම.
- අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් ඇපකරුවන් දෙදෙනාගෙන් එක් අයකු අවම වශයෙන් වසර 03 ක ස්ථිර සේවා කාලයක් පවතින විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු අයකු වීම.
- සියළුම ණය අයදුම්කරුවන්ගේ මාසික වේතනයෙන් 40% සීමාව තුල ණය වාරිකය අයකර ගැනීමේ හැකියාව තිබීම.

වගුව 04 - සුදුසුකම්ලාභීන්ගෙන් ඉදිරිපත් වූ අයදුම්පත්‍ර හා ණය නිකුත් කිරීම පිලිබඳව 2021 වසරේ ප්‍රගතිය පහත වගුවෙන් පැහැදිලි වේ.

මාසය	ණය අයදුම් කළ සංඛ්‍යාව	නිකුත් කල ණය සංඛ්‍යාව	ණය වටිනාකම (රු.)
ජනවාරි	40	**47**	6,000,000.00
පෙබරවාරි	**87**	**82**	13,175,000.00
මාර්තු	**151**	115	16,520,000.00
අප්‍රේල්	76	95	12,800,000.00
මැයි	36	39	5,675,000.00
ජූනි	17	18	3,175,000.00
ජූලි	47	49	7,665,000.00
අගෝස්තු	44	44	6,805,000.00
සැප්තැම්බර්	5	4	450,000.00
ඔක්තෝබර්	107	78	12,615,000.00
නොවැම්බර්	141	138	21,010,000.00
දෙසැම්බර්	217	192	30,835,000.00
එකතුව	968	901	**136,725,000.00**

ප්‍රස්තාරය 02 - **ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය** - 2021



	ජන	පෙබ	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ	සැප්	ඔක්	නොවැ	දෙසැ
ණය අයදුම් කළ සංඛ්‍යාව	40	87	151	76	36	17	47	44	5	107	141	217
නිකුත් කල ණය සංඛ්‍යාව	47	82	115	95	39	18	49	44	4	78	138	192

ණය අයදුම් කළ සංඛ්‍යාව 968 වුවද නිකුත් කල ණය සංඛ්‍යාව 901 ක් විය ලොව පුරා පැවති වසංගත තත්වය මත ණය ඉල්ලුම් කිරීම මෙන්ම ණය නිකුතුවෙහිද පෙර වසරට සාපේක්ෂව පහල අගයක් ගෙන ඇත.

2.3 නිකුත් කල ණය සීමාවන් හා ණය මුදල් වටිනාකම

2021 වසරේ දී රු.75,000.00 සහ රු.150,000.00 නව ණය වර්ග හඳුන්වා දෙන ලදී.

වගුව **05** - **ණය මුදල් සීමාවන් අනුව ප්‍රගතිය.**

උපරිම ණය සීමාව (රු.)	**නිකුත් කල ණය සංඛ්‍යාව**	**ණය මුදල් වටිනාකම (රු.000)**
300,000	25	7,500,000
250,000	129	32,250,000
175,000	304	53,200,000
150,000	73	10,950,000
100,000	280	28,000,000
75,000	21	1,575,000
50,000	57	2,850,000
40,000	4	160,000
30,000	8	240,000
20,000	0	0
එකතුව	**901**	**136,725,000**

2.4 ණය අයකරගැනීමේ ප්‍රගතිය


21018 සිට 2021 දක්වා වසර වලට අදාලව ණය මුදල් නිකුත් කිරීම හා අයකර ගැනීමේ ප්‍රගතිය 06 වන වගුවෙන් හා 03 වන ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ.

- ණය මුදල් නිකුත් කිරීම - අඩු වීම - 37.2%
- ණය අයකර ගැනීමේ - අඩු වීම - 20%

වගුව 06 – 2018 සිට 2021 වසර දක්වා ණය නිකුත් කිරීම සහ ණය අය කර ගැනීම

වර්ෂය	ණය සංඛ්‍යාව	ණය නිකුත් කිරීම (රු. 000)	ණය අයකර ගැනීම (රු. 000)
2018	3636	353,970	411,062
2019	3870	466,220	473,881
2020	1735	217,880	429,989
2021	**901**	**136,725**	**341,582**

ප්‍රස්තාරය -03 ණය නිකුත් කිරීම සහ අයකර ගැනීමේ ප්‍රගතිය



2.5 කාර්යාල සංකීර්ණය - ලෝහෝර් ආර්යා ණය අරමුදල

2.5.1 කුලී ආදායම

ලෝහෝර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ලේ වර්ග අඩි 5,500 ක් අරමුදලේ කාර්යාලය සඳහා භාවිතා කරමින් අතිරික්ත ඉඩකඩ ප්‍රමාණය පහත සහන් ආයතන වලට කුලී පදනම මත ලබා දී 2021 වර්ෂය තුල කුලී ආදායම් වශයෙන් රුපියල් මිලියන 17.69 උපයා ගන්නා ලදී.

වගුව 07 – 2021 වසරේ ගොඩනැගිලි කුලී ආදායම්

අනු අංක	ආයතනය	කුලියට සිටින මහල	වර්ග අඩි ප්‍රමාණය	ආදායම් (රු.)
01	ලෝහෝර් ආර්යා ණය අරමුදල	3 වන මහල	5500	-
02	රථ ගාල	පතුල් මහල	5290	-
03	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	බිම් මහල	5500	7,080,000
04	සමූපකාර සේවක කොමිෂන් සභාව	1 - මහල	2415	2,588,576
05	ලංකා විදුලිබල මණ්ඩලය	1 ,2 මහල	4700	4,800,000
06	ලංකා විදුලිබල මණ්ඩලය තොරතුරු අංශය	2 - මහල	2750	3,139,733
07	කුලී පදනමට ලබා දීමට තිබේ	2 - මහල	840	-
08	කුලී පදනමට ලබා දීමට තිබේ	අංක :100/2	380	82,500
			27375	**17,690,809**

2.5.2 අරමුදලෙහි තිරසාරභාවය


අරමුදලේ මෙහෙයුම් සහ මූල්‍ය තිරසාරභාවය පවත්වා ගැනීම සම්බන්ධයෙන් භාරකාර මණ්ඩලයේ දැඩි අවධානය යොමුව ඇත. මෙම ආයතනය භාණ්ඩාගාරය මත හෝ අයවැය ලේඛන ප්‍රතිපාදන මත යැපෙන ආයතනයක් නොවන අතර සේවක වැටුප් ඇතුළුව සියලුම වියදම් මෙහි පොලී ආදායම සහ ගොඩනැගිලි කුලී ආදායම තුලින් දරනු ලැබේ.පොලී ආදායම තුල මෙහෙයුම් විරස්ථායී බව සහතික කරනු ලබන අතර බොල් ණය, අනෙකුත් පරිපාලන වියදම් සහ ණය ආපසු අයකර ගැනීම සඳහා දැරීමට සිදුවන අනෙකුත් සියලුම වියදම් ද මෙම ආදායම තුල ආවරණය කරගැනීමෙන් අනතුරුව මහජන බැංකුවේ සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවල කර ඇති ස්ථාවර තැන්පතුවල ආයෝජනයෙන් ලැබෙන ස්ථාවර තැන්පතු පොලී ඉපයීම් යොදා ගනී.

ආයෝජන වර්ගය	බැංකුව	2021/12/31 (රු.)	2020/12/31 (රු.)
ස්ථාවර තැන්පතු	මහජන බැංකුව	400,849,332	230,947,066
ස්ථාවර තැන්පතු	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	24,446,002	22,712,231
එකතුව		425,295,334	253,659,297

2.5.3 මෙහෙයුම් ආදායම

2021 වසර තුලදී මුළු මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 98.8 ක් වූ අතර ශුද්ධ මෙහෙයුම් අතිරික්තය රුපියල් මිලියන 38.7 2020 වසර තුලදී මෙහෙයුම් ආදායම හා ශුද්ධ මෙහෙයුම් අතිරික්තය පිළිවෙලින් රුපියල් මිලියන 112 ක් හා රුපියල් මිලියන 52.75 ක් විය .2021 වසරේ පැවති ගෝලීය වසංගත තත්වය මත මෙහෙයුම් කටයුතු අඩාල වීම හේතුවෙන් මෙහෙයුම් ආදායම ඉක්මවා මෙහෙයුම් වියදම වර්ධනය වීම මත 2020 වසරට සාපේක්ෂව 26.5% ක ලාභදායීත්වයේ අඩු වීමක් දක්නට ඇත.

ප්‍රස්තාරය -04 - මෙහෙයුම් ආදායම සහ මෙහෙයුම් අතිරික්තය 2018-2021



03

සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය

3.1 කාර්ය මණ්ඩල පුහුණුව - 2021

2021 වසර මුළුල්ලේ ද ශ්‍රී ලංකාව තුල පැතිරී ගිය කොරෝනා වෛරසය නිසා උද්ගත වූ තුන්වන රැල්ලේ වසංගත තත්වය පාලනය කිරීමටත් ජන ජීවිතය හා රාජ්‍ය සේවය අඛණ්ඩව පවත්වාගෙන යාමටත් සෞඛ්‍ය නීති රීතින්, සංචරණ සීමා සහ පොලිස් ඇඳිරි නීතිය හේතුවෙන් සේවා ස්ථානවලට සේවකයන් නොකැඳවා නිවසේ සිට රාජකාරි කිරීමට සැලස්වීමත් සිදුවිය. වසංගත තත්වය හමුවේ ගන්නා ලද උක්ත පියවර නිසා සාමාන්‍ය ලෙස පවත්වාගෙන ආ රාජ්‍ය යාන්ත්‍රනය බිඳ්ඩනය වීම සේවකයන්ගේ පැමිණීම අඩුවීම, සෞඛ්‍යාරක්ෂණය සඳහා වැඩි අවධානයක් යොමු වීම, වියදම් සීමා කිරීමට සිදු වීම සහ පුද්ගල සෞඛ්‍යාරක්ෂණය හා ආයතන සෞඛ්‍යාරක්ෂණය වෙනුවෙන් වැඩි වියදමක් දැරීමට සිදුවීම යන කරුණු හේතුවෙන්ද චක්‍රීය ක්‍රමයට සේවකයන් සේවයට වාර්තා කිරීම හෝ සේවාස්ථානයට නොකැඳවා නිවසේ සිට රාජකාරි කිරීමට සළැස්වීම නිසා කාර්ය මණ්ඩල පුහුණුව සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ඒ වෙනුවෙන් වැය කිරීම අත්හිටුවන ලදී.

මාර්ගස්ථ ක්‍රමයෙන් පුහුණුව ලැබීමට ප්‍රායෝගිකව අපහසුතා ඇතිවිම, එම ක්‍රමයට දක්වන ලද අකැමැත්ත යන කරුණු මත මාර්ගස්ථ ක්‍රමය ඔස්සේ කාර්ය මණ්ඩළය පුහුණු කිරීම කෙරෙහිද අවධානය යොමු නොවුනි.

3.2 අරමුදලේ බඳවා ගැනීමේ හා උසස්වීමේ පරිපාටින්

<u>උසස්වීම් සහ නව බඳවා ගැනීම්.</u>

3.2.1 2021 වසරේ මුල් භාගයේදී සිදුකිරීමට නියමිතව තිබූ අරමුදල් කාර්ය මණ්ඩලයේ උසස්වීම් ලබා දීම සිදු කළේ නැත. 2021 වසර තුළ කළමණාකරණ සහකාර 111 තනතුරු දරණ නිලධාරීන් දෙදෙනෙකු මුල් කාර්තුව තුළ කළමණාකරණ සහකාර 11 ශ්‍රේණියට උසස් කිරීමට යෙදී තිබුන ද වසංගත තත්වය මත පැන නැඟුනු ප්‍රායොගික අපහසුතාවයන් මත සේවක කාර්යය සාධන ඇගයීම නිසි ලෙස සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන් මෙම උසස්වීම් ලබා දීම නොකෙරිනි.

- නමුත් 2021 වසරේ අවසාන කාර්තුවේ සිට නැවතත් විධිමත් ලෙස කාර්යය සාධන ඇගයීම සිදු කිරීම ආරම්භ කරන ලදි.
- කාර්යාල කාර්ය සහායක එම් හරිවන්ද්‍ර මහතාගේ 11 ශ්‍රේණියේ සිට 1 ශ්‍රේණිය දක්වා උසස් කිරීම නියමිත දින සිට (2018.08.01 දින සිට) සක්‍රිය කිරීම පමණක් 2021 වසර තුළදී සිදු කරන ලදි.

3.2.2 <u>නව බඳවා ගැනීම්</u>

- 2021 වසරේදී කිසිදු නව බඳවා ගැනීමක් සිදු නොකරන ලදි.
- කළමනාකරණ සහකාර ශ්‍රේණියේ නිළධාරීන් තිදෙනෙකු ද (03) විවිධ හේතූන් මත 2021 වසරේදී අරමුදලේ සේවයෙන් ඉවත්වන ලදී.
- 2021 වසර ආරම්භයේදීම පරිවාස කාළයේ රාජකාරියේ නියුතු කළමනාකරණ සහකාර 111 ශ්‍රේණියේ නවක නිළධාරියකු රාජ්‍ය සේවයේ රැකියා පත්වීමක් ලැබීම හේතුවෙන් ඉල්ලා අස්වන ලද අතර 2021 වසර අග භාගය වන විට කළමනාකරණ සහකාර 1 ශ්‍රේණියේ නිළධාරිනියන් දෙදෙනෙකු පිළිවෙලින් විශ්‍රාම ගැන්වීම සහ පෞද්ගලික හේතූන් මත ඉල්ලා අස්වන ලදි.

- ඒ අනුව 2021 වසර අවසානයේදී අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලයේ **කණිෂ්ඨ කළමණාකාර - තොරතුරු තාක්ෂණ තනතුරු 01** ක් ද, **කළමණාකරණ සහකාර (තාක්ෂණික) තනතුරු 01** ක් **කළමණාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරු 04 ක්** ද **කාර්යාල කාර්ය සහයක තනතුරු 01 ක්** ද වශයෙන් **පූර්ණ පුරප්පාඩු සංඛ්‍යාව 7ක් විය.**

3.3 කොරෝනා වසංගත තත්වයට ඔබිනසේ සැකසූ අරමුදල් පරිශ්‍රය නඩත්තු කිරීම

තෙවන සහ සිව්වන වරට ව්‍යාප්ත වූ කොරෝනා වසංගත තත්වය මධ්‍යයේ රාජ්‍ය යාන්ත්‍රනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහාත් අරමුදලේ සේවාදායකයන්ට සෞඛ්‍යාරක්ෂිතව හා කාර්යක්ෂමව ප්‍රශස්ථ මට්ටමේ සේවයක් ලබා දීම සඳහාත් අරමුදලේ ක්‍රියාකාරිත්වය මැනවින් පවත්වාගෙන යාම සඳහාත් අරමුදල් පරිශ්‍රය සහ කාර්යාලය, සෞඛ්‍ය නීති රීති වලට අනුකූලව තවදුරටත් නඩත්තු කර පවත්වා ගැනීම සිදුවිය. ඒ අනුව අරමුදල් පරිශ්‍රයෙහි ප්‍රධාන පිවිසුම අසල සවිකරන ලද අත් සෝදා පිරිසිදු කිරීම සඳහා වූ ජල කරාම සහිත බේසම්, පා පිරිසිදු කිරීම සඳහා පිවිසුම් ඉදිරියේ යෙදූ විෂබීජ නාශක දියර සහිත පා පිස්නාවන්, තවදුරටත් නඩත්තු කර පවත්වාගන්නා ලදි. විෂබීජ නාශක දියර, අත් ශෝධන දියර , සබන් හා මුඛ ආවරණ ලබා දීම අඛණ්ඩව සිදු කරන ලදි. විටින් විට පරිශ්‍රය විෂබීජානුහරණය කිරීම, කාර්යාලයේ කවුන්ටර, සම්මුඛ පරීක්ෂණ ඇංශය, ණය අයදුම්පත් භාර ගන්නා කවුළුව හා අයකැමි අසල යොදන ලද ඉටි තිර - ආරක්ෂිත ආවරණ නඩත්තු කර පවත්වා ගැනීම වැනි ආරක්ෂිත සැළසුම් හා පියවර අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබීය. එමගින් සෞඛ්‍යාරක්ෂිතව සේවාලාභීන්ට මෙන්ම සේවාදායකයින්ගේ ද කාර්යක්ෂම අඛණ්ඩව සේවය තහවුරු කරන ලදී.

එකී සැලසුම් එළෙසම 2021 වසර පුරාම පවත්වාගෙන යාමට කටයුතු කළ අතර කොරෝනා වසංගත තත්වයට ඔබින සේ සැකසූ අරමුදල් පරිශ්‍රය නිසි ලෙස නඩත්තු කර සේවාදායකයන්ගේ, බදුකුළී කරුවන්ගේ සහ අරමුදලේ සේවකයන්ගේ සෞඛ්‍ය ආරක්ෂිත භාවය තහවුරු කර සැමට ආරක්ෂිත කාර්යාල පරිශ්‍රයක් පවත්වාගෙන යන ලදි.

3.3.1 අරමුදල් පරිශ්‍රයේ අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු

අරමුදල් ගොඩනැඟිල්ලේ බදු කුළීකරුවන් විසින් පෙන්වා දෙන ලදුව අත්‍යාවශ්‍ය අළුත්වැඩියාවන් සිදු කිරීමට කරන ලද ඔවුන්ගේ බළවත් ඉල්ලීම මත භාරකාර මණ්ඩළය බස්නාහිර පළාත - පළාත් ඉංජිනේරු කාර්යාංශය මගින් එම පිළිසකරයන් සිදුකිරීමට අනුමැතිය ලබා දෙන ලදි.ඒ අනුව බස්නාහිර පළාත - පළාත් ඉංජිනේරු කාර්යාංශය විසින් හඳුනාගත් අරමුදල් ගොඩනැඟිල්ලේ සිදුකළ යුතු අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු වශයෙන් අරමුදල් ගොඩනැඟිල්ලේ වහළය පිළිසකර කිරීම, දෙවැනි මහළේ පිරිමි වැසිකිළි පද්ධතිය අළුත්වැඩියාව සහ අනෙකුත් මූලික අළුත්වැඩියාවන් සඳහා රු720,000/00ක ඇස්තමේන්තුගත මුළු මුදලට ඉදිරිපත් කරන ලද ප්‍රමාණපත පරිදි 2021.03.29 දින ආරම්භ කරන ලද අළුත්වැඩියා ව්‍යාපෘතිය යටතේ එකී අත්‍යාවශ්‍ය අළුත්වැඩියාවන් සියල්ල 2021.07.01න් සිදු කර අවසන් කරන ලදි.

3.4 කාර්ය මණ්ඩල පරිපාලන හා කාර්යාලීය ක්‍රමවේදයන් විධිමත් කිරීම.

- කාර්ය මණ්ඩල පුහුණුව භාරකාර මණ්ඩල උපදෙස් අනුව අත්හිටුවන ලදී.
- විටින් විට රට තුල පැනවූ සංචරණ සීමා හා ඇදිරි නීතිය හේතුකොටගෙන කාර්ය සාධන ඇගයීම් ක්‍රමයට අනුව සේවකයින්ගේ කාර්ය සාධන ඇගයීම හා ලකුණු ලබා දීම සිදු කළ නොහැකි වූයෙන් එම ක්‍රමවේදය 2021 වසරේ මුල් කාර්තුවල දී ක්‍රියාත්මක නොවීය. නමුත් අවසාන කාර්තුවේ සිට භාරකාර මණ්ඩළ අනුමැතියට යටත් කර විධිමත් ලෙස සේවකයන්ගේ කාර්යය සාධන ඇගයීම යළිත් අරඹන
- ලෝහොර් ආර්යා ණය අරමුදලේ සේවය කරනු ලැබූ කාර්යය මණ්ඩළයේ දුවා දරුවන් අරමුදලේ සේවය සඳහා විවෘත බඳවා ගැනීම සඳහා ලබා දෙන ලකුණු පටිපාටිය භාරකාර මණ්ඩළය විසින් අනුමත කර එම ක්‍රමවේදය අරමුදලේ ස්ථාපිත කරන ලදි.
- අරමුදලේ සේවයට බැඳෙන නවක පත්වීම්ධාරීන් ඉතා කෙටි කාළයක් සේවයෙන් පසු වෙනත් රැකියා අවස්ථාවන් සොයා යෑම, විවාහ ජීවිතයට ඇතුල්වීම ආදී විවිධ කරුණු මත සේවය හැරයාම නිසා අරමුදලේ පුරප්පාඩු සංඛ්‍යාව ඉහළයාම, බඳවා ගැනීමේදී ඉහළ පිරිවැයක් අරමුදලට දැරීමට සිදුවීම, අධික පිරිවැයක් හා පරිශ්‍රමයක් යොදා සිදුකරන බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය ඵළදායී නොවීම සහ දරන ලද පිරිවැයට අනුව සේවකයන්ගේ ඵලදායීතාවය ලබා ගැනීමට නොහැකිවීම , යන කරුණු සඳහා පිළියමක් ලෙස බඳවා ගන්නා නවක පත්වීම්ධාරීන් ඔවුන්ගේ පරිවාස කාලය සම්පූර්ණ වන තෙක් සේවය කරන බවට ගිවිසුමක් අත්සන් කිරීමේ ක්‍රමවේදය භාරකාර මණ්ඩළය විසින් අනුමත කර ස්ථාපිත කරන ලදි.
- කඩඉම් පරීක්ෂණ හා භාෂා ප්‍රවීණතා විභාගයන් නොපැවැත්විය.

- 2021 වසර තුළ පැවතුනු වසංගත තත්වය මත සේවා ස්ථානයට පැමිණ රාජකාරී කිරීම අවම වීම, නිවසේ සිට රාජකාරී කිරීමට සිදුවීම,ඇඟළුම් කර්මාන්ත ශාලා ක්‍රියාකාරිත්වය අඩාල වීම යන හේතූන්ගේ බලපෑම මත කාර්ය මණ්ඩළය සඳහා වාර්ෂිකව නිකුත් කරන ටී ෂර්ටය 2021 වසරේදී ද සේවක මණ්ඩළය වෙත නිකුත් නොකරන ලදි.

- **<u>අරමුදලේ සංවත්සර සැමරුම</u>**

සමස්ථ ශ්‍රී ලංකාවාසී රාජ්‍ය සේවකයන්ට ඉමහත් සහනයක් සැළසූ ලෝහෝර් ආර්යාවට කෘතගුණ දකවනු වස් එතුමිය ස්මරණය කරමින් අරමුදලේ දීර්ඝ ඉතිහාසයේ ප්‍රථම වරට මහා සංඝරත්නය විෂයයේ දානමය පිංකමක් සිදුකර පිංපෙත් පැමිණවීමට පාලන භාරකාර කමළා රණතුංග මැතිණිය විසින් කරන ලද යෝජනාව භාරකාර මණ්ඩළය විසින් ඒකමතිකව අනුමත කරන ලදුව 94 වන සංවත්සරය නිමිත්තෙන් දහවල් සාංඝික දානමය පිංකමක් සංවිධානය කර පවත්වන ලදි . 2021.03.27 වන දින අරමුදලට වසර 94ක් පිරීම නිමිත්තෙන් පවත්වන ලද 94 වන සංවත්සරයේදී මීට දශක නවයකට පෙරාතුව අරඹන ලද ලෝහෝර් ආර්යා ණය අරමුදලේ නිර්මාතෘවරිය වන ජීන් ලෝහෝර් ආර්යාව ස්මරණය කර එතුමියට පිං පැමිණවීම හා ජීන් ලෝහෝර් ආර්යාව ප්‍රමුඛ අරමුදලේ සේවය කර පරලෝ සැපත් සියල්ලන්ට ද සභාපතිතුමිය, පාලන භාරකාරතුමිය, භාරකාර මණ්ඩළය සහ සමස්ථ කාර්යය මණ්ඩළයටම සෙත් පැතීම ද සිදු කරන ලදි. මෙම මහා පුණ්‍ය ක්‍රියාව ඉෂ්ඨ සිද්ධ කර ගැනීම පිණිස භාරකාර මණ්ඩළයේ ද කාර්ය මණ්ඩළයේ ද ජාතික ලොතරැයි මණ්ඩළයේ ද අනුග්‍රාහක දායකත්වය ලැබිනි.

<u>ලෝහෝර් ආර්යා ණය අරමුදලේ 94 වන සංවත්සරයේ විශේෂ අවස්ථා</u>








3.5 කාර්ය මණ්ඩල ණය

- ආයතනික කාර්ය මණ්ඩල ණය ක්‍රමවේදය වෙනසකට ලක් කරමින් අරමුදලේ කාර්යය මණ්ඩලයට හෝ ඔවුන්ගේ දුවා දරුවනට ටැබ් යන්ත්‍රයක් මිළදී ගැනීම සඳහා 4.5% පොළී අනුපාතිකය යටතේ රු.100,000/00ක ණය මුදලක් කාර්යය මණ්ඩලයට ප්‍රදානය කිරීමේ නව ණය ක්‍රමවේදය හඳුන්වා දී ස්ථාපිත කරන ලදි.
- 2021 අගෝස්තු මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අරමුදල මගින් නිකුත් කරන ණය ප්‍රවර්ධනය කරනු පිණිස 10% දක්වා පොළී ප්‍රතිශතය අඩු කරන ලදි.

3.6 ඉඩම් ඔප්පු සහ බැඳුම්කර.

අරමුදල ආරම්භ කළ අවධියේදී, ඉඩම් (ඔප්පු) ඇපයට තබා ණය ලබා ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වී ඇත. මෙම ක්‍රමය යටතේ ණය ලබා දුන් ඇප බැඳුම්කර 267 ක් 1960 වසරේ සිට මෙම ආයතනයට වගකීමක්ව පවතී. මෙම ක්‍රමය යටතේ ණය දීම තවදුරටත් ක්‍රියාත්මක නොවන බැවින් විධිමත් විගණන කමිටු නිර්දේශයකින් අනතුරුව , එම බැඳුම්කර අදාළ දේපළ පිහිටා ඇති ප්‍රදේශ අනුව එම දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයවලට බැඳුම්කර නිදහස් කර ඒවායේ සඳහන් පාර්ශවයන් නමින් එකී අවලංගු කිරීම් ලියාපදිංචි කර තවදුරටත් මෙම ආයතනය වෙත පැවරී ඇති වගකීම අවසන් කිරීමට 831 භාරකාර මණ්ඩල විසින් අනුමැතිය ලබා දෙන ලදී. ඊට අදාලව බැඳුම්කර 191 නිදහස් කර ඇති නමුත් 2021.01.01 සිට 2021.12.31 දින දක්වා කාළය තුළ බැඳුම්කර නිදහස් කිරීමක් සිදු වූයේ නැත.

3.7 භාරකාර මණ්ඩල රැස්වීම්

2021 වසර තුළ භාරකාර මණ්ඩල රැස්වීම් 8 ක් පවත්වන ලදි.

කොවිඩ් 19 කොරෝනා වෛරසයෙන් ඇති වූ තෙවන හා සිව්වන වසංගත තත්වයන් රට තුළ ව්‍යාප්ත වූ විට රාජ්‍ය යාන්ත්‍රනය අකර්මන්‍ය නොවී පවත්වාගෙන යාමට ගත් විධි විධාන යටතේ අරමුදලේ ක්‍රියාකාරීත්වය හා පැවැත්ම තහවුරු කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කර ව්‍යදම් කළමනාකරණය කරමින් ස්ථාපිත සැළසුම් මැනවින් පවත්වාගෙන යාම සඳහා පවත්වන ලද විශේෂ රැස්වීම් හා කාර්ය මණ්ඩල රැස්වීම්වලදී සාකච්ඡා කරන ලද වැදගත් කරුණු භාරකාර මණ්ඩල අනුමැතිය ඇතිව ක්‍රියාත්මක කරන ලදි.

3.8 විගණන හා කළමණාකරණ කමිටුව

2021 වසරේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් පහත සඳහන් පරිදි පවත්වන ලදි. විමසුම් සම්බන්ධ ලේඛන විගණක කමිටුවේදි සාකච්ඡා කර භාරකාර මණ්ඩලයේ උපදෙස් සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.එමෙන්ම එකී විමසුම් වාර්තා වලින් පැන නැඟුනු වැදගත් කරුණු භාරකාර මණ්ඩල අනුමැතිය යටතේ ක්‍රියාත්මක කරන ලදි.

අනු අංකය	කමිටු පැවැත් වූ දින
01	2021.03.22
02	2021.08.06
03	2021.12.14

04

අනාගත සැලසුම්

- වර්තමානයේ රාජ්‍ය සේවකයන්ට පමණක් සපයනු ලබන ලෝහෝර් ආර්යා ණය අරමුදලේ මූල්‍ය පහසුකම් අනාගතයේ දී පෞද්ගලික අංශයේ සේවකයින්ට ද ලබා දීමට හැකි වන පරිදි මුදල් උත්පාදනය කර ගැනීම සඳහා ලෝහෝර් ආර්යා අරමුදල් පනතේ වගන්ති වර්තමානයට ගැලපෙන අයුරින් සංශෝධනය කිරීම.

- අරමුදල සේවා සම්පාදන මට්ටමේ ණය දෙන ආයතනයක් බවට පත්කොට එහි වපසරිය සහ ක්‍රියාකාරකම් ණය ලාභීන්ට ප්‍රයෝජනවත් පරිදි වෙනස් කිරීම.

- අරමුදල් කාර්යාලයේ විදුලි තත් ඇදීමේ කාර්යය සහ අභ්‍යන්තර අලංකරණ කාර්යය අළුතින් නිම කරවා ගැනීම

POPE & COMPANY
Chartered Accountants
No. 07, Hudson Road,
Colombo 03, Sri Lanka.

Tel : +94 11 2341737
+94 11 2541331
Fax : +94 11 2341737
E-mail : popeco@sltnet.lk
Website : www.popeco.lk

ස්වාධීන විගණකගේ වාර්තාව
ලෝහෝර් ආර්යා ණය අරමුදල් සාමාජිකයන් වෙත

මූල්‍ය ප්‍රකාශන විගණනය මත වාර්තාව

මතය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය තත්ව ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයන් සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත ලෝහෝර් ආර්යා ණය අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර.) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව අප විසින් දරන්නා වූ මතය වේ.

මතය සඳහා පදනම

අප විසින් අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (ශ්‍රී.ල.වි.ප්‍ර.) අනුකූලව සිදු කරන ලදී. එම ප්‍රමිතීන්ට අනුකූලව අපගේ වගකීම් පිළිබඳව අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම යන ඡේදය යටතේ වැඩිදුරටත් විස්තර කෙරේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආචාර ධර්ම සංග්‍රහයේ සඳහන් ආචාර ධර්ම අවශ්‍යතාවයන්ට අනුකූලව අපගේ මූල්‍ය ප්‍රකාශන විගණනයට අදාළ වන පරිදි අප අරමුදලෙන් ස්වාධීන විගණකවරු ලෙස කටයුතු කරන අතර, ආචාර ධර්ම සංග්‍රයයේ දැක්වෙන අනෙකුත් වෘත්තීය ආචාර ධර්මයන්ට අනුකූලව ද අප විසින් කටයුතු කර ඇත. අප ලබා ගත් විගණන සාක්ෂි අපගේ මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය බව අප විශ්වාස කරමු.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ කළමනාකාරිත්වයේ සහ පාලනය පිළිබඳ වගකිව යුතු පාර්ශවයන්ගේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකාරිත්වයේ වගකීම වන අතර, එකී මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු වීම සඳහා අවශ්‍යයැයි හැඟෙන අභ්‍යන්තර පාලනයන් හඳුන්වා දී භාවිතා කිරීමට ද කළමනාකාරිත්වය වගකීමෙන් බැඳේ.

මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ අපගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම අපගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ආයතනය ඇවර කිරීමට හෝ මෙහෙයුම් කටයුතු නැවැත්වීම තීරණය කර ඇති විටක හෝ ඉහත විකල්පයන් හැර වෙනත් විකල්පයක් නොමැති අවස්ථාවක හැර ආයතනය විසින් අඛණ්ඩ පැවැත්ම උපකල්පනයට අනුකූලව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කළමනාකාරිත්වයේ වගකීම වේ.

මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම, සමාගමේ පාලනය පිළිබඳ වගකිව යුතු පාර්ශවයේ වගකීම වේ.

Pope & Co.
වරලත් ගණකාධිකාරීන්
දිනය : 2022/11/28

ලෝහෝර් ආර්යා ණය අරමුදල
2021 දෙසැම්බර් **31** දිනට
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	සටහන	**31/12/2021**	**31/12/2020**
		රු.	රු.
පොලී ආදායම	**5**	67,797,934	86,229,225
අනෙකුත් ආදායම්	**6**	36,058,369	28,203,408
		98,856,303	**114,432,633**
මෙහෙයුම් වියදම්			
පුද්ගල වැටුප් වියදම්	**7**	(35,221,534)	(34,128,246)
භූමිය, උපකරණ, ආයතනික වියදම්	**8**	(14,450,373)	(13,562,772)
ගාස්තු සහ කොමිස්	**9**	(684,433)	(791,104)
		(50,356,340)	**(48,482,122)**
බදුකරණයට පෙර ලාභය		**48,499,963**	**65,950,511**
බදු වියදම්	**10**	(9,749,747)	(13,197,841)
වර්ෂය සඳහා ලාභය		**38,750,216**	**52,752,671**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සම්බන්ධ කර කියවිය යුතුයි. එමෙන්ම සටහන් මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය අංගයක් වේ.

ලෝහෝර් ආර්යා ණය අරමුදල
2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

	සටහන	31/12/2021	31/12/2020
		රු.	රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	18	79,963,687	83,146,654
ආයෝජන (දේපල)	19	25,257,140	26,247,617
		105,220,827	**109,394,271**
ජංගම වත්කම්			
භාණ්ඩ ලේඛණ		325,554	293,726
ණය සහ අත්තිකාරම්	11	217,228,841	342,144,275
අනෙකුත් වත්කම්	12	6,962,671	5,391,980
ස්ථාවර තැම්පතු මත ආයෝජනය	13	425,295,334	253,659,297
මූල්‍යමය හා කෙටි කාලීන වත්කම්	**14**	11,796,966	16,057,239
		661,609,366	**617,546,517**
මුළු වත්කම්		**766,830,193**	**726,940,788**
අරමුදල්,සංචිත සහ වගකීම්			
අරමුදල් හා සංචිත			
සමුච්චිත අරමුදල		576,887,092	538,155,582
ප්‍රත්‍යා ගණන සංචිත		146,649,586	146,649,586
මුළු අරමුදල් හා සංචිත		**723,536,678**	**684,805,168**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	**15**	22,696,045	20,846,540
		22,696,045	**20,846,540**
ජංගම වගකීම්			
අනෙකුත් වගකීම්	**16**	15,092,994	15,131,193
ආදායම් බදු	**17**	5,504,476	6,157,888
		20,597,470	21,289,081
මුළු වගකීම්		**43,293,515**	**42,135,621**
මුළු අරමුදල්,සංචිත සහ වගකීම්		**766,830,193**	**726,940,788**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සම්බන්ධ කර කියවිය යුතුයි. එමෙන්ම සටහන් මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය අංගයක් වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇති බවට මින් සහතික වෙමි.

.....
ගණකාධිකාරි

මෙම මූලය ප්‍රකාශන පිලියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම භාරකාර මණ්ඩලය විසින් දරනු ලැබේ.

භාරකාර මණ්ඩලය වෙනුවෙන් අත්සන්

.....
සභාපති
දිනය : 2022.01.20

.....
පාලන භාරකාර
දිනය : 2022.11.25

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම් / ප්‍රාග්ධන වෙනස්වීම් ප්‍රකාශය

	ප්‍රත්‍යා ගණන සංචිතය	සමුච්චිත ලාභය රු.	මුළු ශුද්ධ වත්කම් රු.
2020.01.01 දිනට ශේෂය	146,649,586	485,525,825	**632,175,411**
පෙර වසර සඳහා වූ ගැලපීම්	-	(122,914)	(122,914)
වසරේ ලාභය	-	52,752,671	52,752,671
2020.12.31 දිනට ශේෂය	**146,649,586**	**538,155,582**	**684,805,168**
2021/01/01 දිනට ශේෂය	146,649,586	538,155,581	**684,805,168**
පෙර වසර සඳහා වූ ගැලපීම්	-	(18,705)	(18,705)
වසරේ ලාභය	-	38,750,216	38,750,216
2021.12.31 දිනට ශේෂය	**146,649,586**	**576,887,092**	**723,536,678**

ලෝහෝර් ආර්යා ණය අරමුදල
2021 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2021/12/31 රු.	2020/12/31 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
වසරේ ශුද්ධ ලාභය	48,499,963	65,950,511
<u>ගැලපීම්</u>		
ක්ෂය	4,436,608	4,241,205
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	3,782,405	3,551,332
පෙර වසර සඳහා වූ ගැලපීම්	(18,705)	(122,914)
රජයේ දීමනාවන්	-	(2,093,230)
වත්කම් බැහැර කිරීම මත ලාභය	(11,940)	-
ස්ථාවර තැම්පතු මත පොලී ආදායම	(17,782,634)	(8,763,653)
මෙහෙයුම් වත්කම් වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය	**38,905,697**	**62,763,251**
<u>**මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහය**</u>		
භාණ්ඩ ලේඛන (වැඩිවීම්/අඩුවීම්)	(31,828)	(41,396)
ණය සහ අත්තිකාරම් (වැඩිවීම්/අඩුවීම්)	124,915,434	112,475,443
අනෙකුත් වත්කම් (වැඩිවීම්/අඩුවීම්)	(260,327)	(408,164)
අනෙකුත් වගකීම් (වැඩිවීම්/අඩුවීම්)	(38,199)	3,471,001
	124,585,080	**115,496,884**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	163,490,778	178,260,135
පාරිතෝෂි ගෙවීම්	(1,932,900)	-
බදු ගෙවීම්	(10,403,160)	(14,324,749)
	(12,336,060)	(14,324,749)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද/ භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රවාහය	**151,154,718**	**163,935,385**
<u>**ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය**</u>		
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම්	(276,087)	(1,214,072)
ආයෝජන වල (වැඩිවීම්/අඩුවීම්)	(171,636,037)	(183,763,653)
දේපල,පිරියත සහ උපකරණ විකිණීම	24,862	
ලද පොලී	16,472,270	8,763,653
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(155,414,991)**	**(176,214,072)**
<u>**මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය**</u>		
මුදල් හා සමාන දෑ වල ශුද්ධ (වැඩිවීම්/අඩුවීම්)	(4,260,273)	(12,278,686)
වර්ෂය ආරම්භයේ දී ඇති මුදල් හා ඒ සමාන දෑ	16,057,239	28,335,925
වර්ෂය අවසානයේ දී ඇති මුදල් හා ඒ සමාන දෑ	**11,796,966**	**16,057,239**
<u>**වර්ෂ අවසානයේ ශේෂ පත්‍රය/ මුදල් සහ ඒ හා සමාන දෑ**</u>	**2021**	**2020**
තැම්පතු මුදල්	11,776,966	16,037,239
අතැති මුදල්	20,000	20,000
	11,796,966	**16,057,239**

ලෝහෝර් ආර්යා ණය අරමුදල

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්

ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති

01. පොදු

1951 අංක 38 දරන ලෝහෝර් ආර්යා ණය අරමුදලේ (භාරකාර මණ්ඩලය) පනත (1956 සංශෝධිත) මඟින් ස්ථාපනය කරන ලද ලෝහෝර් ආර්යා ණය අරමුදල ශ්‍රී ලංකාවේ නීත්‍යවාසික අරමුදලකි. අරමුදලෙහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 02, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතෙහි අංක 100,3/2 දරණ ස්ථානයේ පිහිටා ඇත.

1.1 අනුකූලතා ප්‍රකාශණය

මූල්‍ය ප්‍රකාශණ පිළියෙළ කර ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලවය. (SLPSAS)

1.2 මූල්‍ය ප්‍රකාශණ සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා භාරකාර මණ්ඩලය වගකීම දරයි.

1.3 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශණ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

1.4 ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

සියළුම ද්‍රව්‍ය පශ්චාත් ශේෂපත්‍ර සිදුවීම් සැලකිල්ලට ගනු ලැබ ඇති අතර අවශ්‍යතන්හි මූල්‍ය ප්‍රකාශන සඳහා වූ අදාල සටහන් වල ගැලපුම් හෝ අනාවරණයන් සිදුකර ඇත.

1.5 බදු

වර්තමාන බදු

මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් වන ආදායම් බදු ගණනය ආදායම් බදු විධිවිධාන අනුකූලව ආදායම් හා වියදම් මුලද්‍රව්‍ය මත 2017 අංක 24 දරණ සංශෝධිත ආදායම් බදු පනතට අනුව සිදු කර ඇත.

1.6 ආනුශංගික තොරතුරු

ණය අරමුදලට අදාල වන ප්‍රතිපත්තීන් වෙනත් ආකාරයකින් විශේෂයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස, පූර්ව වර්ෂයේ යොදා ගන්නා ලද ප්‍රතිපත්තීන් හා අනුකූල වේ. ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම පිණිස අවශ්‍ය අවස්ථාවන්හි දී පූර්ව වර්ෂයේ සංඛ්‍යා නැවත පිළියෙල කර තිබේ.

02. වත්කම් සහ එහි වටිනාකම් තක්සේරු කිරීමේ පදනම

2.1 බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන

බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන සපයනු ලබන්නේ භාරකරුවන් විසින් සිදුකරනු ලබන සමාලෝචන පදනම් කරගෙන වන අතර පාරිභෝගිකයින් සඳහා වූ ණය වාර්තාකරනු ලබන කාල සීමාව අවසානයේදී ඉදිරියට ගෙන යන ලද හිඟ ශේෂයෙන් සපයනු ලබන ප්‍රතිපාදන අඩු කර තිබේ.

2.2 ස්ථාවර තැන්පතු

නුදුරු අනාගතයේ දී කෙටිකාලීන වෙළඳාමක් සඳහා ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ස්ථාවර තැන්පතු සහ අනෙකුත් පොලී තැන්පත් සුරැකුම්පත් සඳහා වියදම් වශයෙන් එකතු කරනු ලැබේ.

2.3 දේපල පිරියත සහ උපකරණ

දේපල පිරියත සහ උපකරණ මිලදි ගැනීමේ පිරිවැය සහ ඒ මත යෙදෙන යම් වියදම් ද දක්වා තිබේ.මෙම වත්කම් පහත සඳහන් කර ඇති සමුච්චිත ක්ෂය කිරීම් අඩුකර ලැබෙන පිරිවැයට දක්වා ඇත.

ගොඩනැගිලි	4%
ගෘහ භාණ්ඩ සවි කිරීම්	10%
පරිසණක උපකරණ	25%
කාර්යාල උපකරණ	10%
විදුයුත් අනුසිහුම්	10%
මෝටර් රථ	25%

2008/09 වසරේ සිට ණය අරමුදල එහි ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වෙනස් කර ඇත්තේ වත්කම් මිලදී ගත් දින සිට ඒවා බැහැර කරන මාසය දක්වා ක්ෂය කිරීම පිණිසය.

2007/08 වසර සඳහා වර්ෂය තුලදි භාවිතා කරන ලද වත්කම් සඳහා ද ක්ෂය කිරීම සිදු නොකරන ලද අතර වත්කම් බැහැර කරන වසර තුළදි ද ක්ෂය කිරීම සිදු නොකරන ලදි.

2.4 අනෙකුත් ලැබිය යුතු දෑ

අනෙකුත් ලැබිය යුතු දෑ සඳහන් කර ඇත්තේ එම නිශ්කාශනය කිරීම සඳහා තක්සේරු කරන ලද ප්‍රමාණයට අනුවය.

2.5 මුදල් හා ඒ සමාන දෑ

මුදල් හා මුදල් සමාන අයිතම ඉල්ලුම් තැන්පතු සහ කෙටිකාලීන අධික ද්‍රවශීලතාවයෙන් යුතු ආයෝජන මුදල් අගයට සැලකිය යුතු වෙනසක් ඇති නොවන ආකාරයට මුදල් හුවමාරු කර ගත හැකි මූල්‍යමය වත්කම් ලෙස නිර්වචනය කර ඇත.

අරමුදල් ප්‍රවාහ ප්‍රකාශණය වක්‍ර ක්‍රමය භාවිතා කරමින් පිළියෙළ කර ඇත.

03. වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි දන්නා සියළුම වගකීම් ඉදිරිපත් කර තිබේ.

3.1 ප්‍රාග්ධන බැඳීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා අදාල සටහන් වල අරමුදලෙහි ප්‍රාග්ධන බැඳීම් අනාවරණය කර ඇත.

3.2 විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ

විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන සපයා ඇත. භාරකාර මණ්ඩලය විසින් යොදා ගනු ලබන පාරිතෝෂික සමීකරණයට අනුකූලව ප්‍රතිපාදන ගණනය කර තිබේ.

3.3 නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

ව්‍යවස්ථාපිත තත්ත්වයන් හා රෙගුලාසි මත ලෝහෝර් ආර්යා ණය අරමුදල් කාර්ය මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක වී ඇත. අරමුදල විසින් 16% සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වයක් ද, 3% සේවක භාරකාර අරමුදල සඳහා දායකත්වයක් ද සෑම සාමාජිකයෙකු වෙනුවෙන්ම දරනු ලබයි.

04. ආදායම් ප්‍රකාශනය

4.1 ආදායම් හඳුනා ගැනීම

4.1.1 ණය පොලී ආදායම

ණය පොලී ආදායම උපචිත පදනම මත ගණනය කර ඇත.

රාජ්‍ය අංශයේ සේවකයන්ට ලබාදුන් ණය වලින් මාස 03 ක් සඳහා ණය ප්‍රතිපාදන නොලැබුණු ක්‍රියාකාරී නොවන ණය පිළිබඳ අරමුදල අවධානය යොමු කරන අතර ඉන් පසුව එම ණය මත ලැබෙන පොළිය මුදල් පදනම මත ගණනය කරනු ලබයි.

4.1.2 බදු කුලී ආදායම

බදු ගිවිසුම මත අරමුදල් පරිශ්‍රයේ පදිංචිව සිටින කුලී නිවැසියන්ගේ ගොඩනැගිලි කුලී ආදායම උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

4.1.3 වියදම් හඳුනාගැනීම

ණය අරමුදල අඛන්ඩව පවත්වාගෙන යාමට සහ ස්ථාවර වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාමෙහිලා ජනිත වන සියළුම වියදම් වසරේ ලාභය ගණනයේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

යම් වත්කමක පවත්නා ස්වභාවය වැඩිදියුණු කිරීමට ව්‍යාප්ත කිරීමට වත්කමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් දරනු ලබන හෝ ණය අරමුදලෙහි ඉපයීම් ධාරිතාව වැඩිදියුණු කිරීමෙහිලා ජනිත වන සියළුම වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලබයි.

		31/12/2021 රු.	31/12/2020 රු.
5	**ආදායම්**		
	රාජ්‍ය සේවකයින් සඳහා වූ ණය	62,043,340	85,584,502
	පොලී ආදායම - 11.5% (රු.250,000/- කාර්ය මණ්ඩල ණය)	353,531	355,744
	නව කාර්ය මණ්ඩල ණය මත පොලී - 4.5%	311,471	235,701
	ටැබ යන්ත්‍ර ණය මත පොලී	44,625	-
	පොලී ආදායම් - 11.5% (රු.100,000/- කාර්ය මණ්ඩල ණය)	42,694	49,769
	විශේෂ අත්තිකාරම් ණය මත පොලී	2,202	3,171
	පාපැදි ණය මත පොලිය	71	338
		62,797,934	**86,229,225**
6	**අනෙකුත් ආදායම්**		
	ස්ථාවර තැම්පතු සඳහා පොලිය	17,782,634	8,763,653
	කුලී ආදායම	17,690,809	17,050,859
	ණය අලාභ ප්‍රතිපාදන (ආපසු එකතු කිරීම)	366,527	-
	අයැදුම්පත් අලෙවියෙන් ලැබූ ආදායම	149,550	193,350
	අනෙකුත් ආදායම්	39,850	95,566
	විශේෂ ආදායම්	29,000	6,750
	මුදල් අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද දීමනා	-	2,093,230
		36,058,369	**28,203,408**
7	**සේවක මණ්ඩල පිරිවැය**		
	වැටුප්	18,702,743	18,622,368
	දීමනාව (කාර්ය මණ්ඩල දීමනාව)	4,185,644	4,038,794
	විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදන	3,782,405	3,551,332
	කාර්යාල සේවක අර්ථසාධක අරමුදල	3,663,057	3,602,716
	පාලන භාරකාරතුමාගේ දීමනාව	1,874,200	1,705,958
	වාර්ෂික ප්‍රසාද දීමනා	687,500	675,625
	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	686,823	675,232
	සභාපති දීමනාව	434,900	426,220
	විශේෂ අත්තිකාරම්	403,475	409,453
	භාරකාර මණ්ඩල සාමාජික දීමනා	264,039	33,000
	පාලන භාරකාරතුමියගේ ඉන්ධන දීමනාව	245,110	231,353
	කරුණාසහගත දීමනා ගෙවීම	141,300	-
	විගණන කමිටුව	86,890	-
	අතිකාල	55,186	140,660
	නිහ වැටුප්	8,261	15,535
		35,221,534	**34,128,246**

		31/12/2021	31/12/2020
		රු.	රු.
8	**පරිශ්‍රය, උපකරණ සහ ස්ථාපිත වියදම්**		
	ක්ෂය වීම	4,436,608	4,174,351
	මුද්‍රණය හා ලිපි ද්‍රව්‍ය	1,860,028	1,689,902
	වරිපනම් සහ රජයේ ඉඩම් සඳහා බදු	1,849,720	1,844,600
	ආරක්ෂක ගාස්තු	1,723,550	1,727,710
	විදුලිය	873,560	845,476
	නඩත්තු - පරිගණක	800,468	653,338
	නඩත්තු - ගොඩනැගිලි	797,540	9,515
	ඉන්ධන සහ මෝටර් රථ ගාස්තු	501,841	505,163
	දුරකථන	392,358	366,259
	නඩත්තු - විදුලි සෝපාන	252,081	959,882
	නඩත්තු - කාර්යාල උපකරණ	197,395	232,955
	තැපැල් හා විදුලි පණිවිඩ	162,270	206,180
	කාර්ය මණ්ඩල සුබ සාධන - නිළ ඇඳුම්	141,572	-
	පරීක්ෂාකිරීමේ ගාස්තු	115,160	5,940
	ජලය	97,080	95,749
	ගොඩනැගිලි රක්ෂණ	74,618	74,618
	පරිත්‍යාග	63,000	-
	මුද්දර ගාස්තු	57,800	65,700
	පුවත්පත් හා වාරප්‍රකාශන	32,594	21,074
	නිල බංගලා වියදම්	14,221	7,392
	රජයේ ඉඩම් බදු	5,000	5,000
	ප්‍රවාහන	1,910	2,200
	දැන්වීම්	-	69,768
		14,450,373	**13,562,772**
9	**ගාස්තු සහ කොමිස් මුදල්**		
	උපදේශන සේවා ගාස්තු	229,379	-
	වෘත්තීය ගාස්තු	180,000	5,000
	නීති ගාස්තු	123,913	364,800
	විගණන ගාස්තු	80,000	75,000
	බැංකු ගාස්තු	33,220	49,510
	බදු ගොනු කිරීමේ ගාස්තුව	25,000	-
	අපහරණය කල ගිණුම	12,922	-
	ණය අලාභ සඳහා ප්‍රතිපාදන	-	296,794
		684,433	**791,104**

			31/12/2021	31/12/2020
10	**බදු සඳහා වියදම්**		රු.	රු.
	ව්‍යාපාරයෙන් උපයන ලද පොලිය මත ලාභය			
	බදු පෙර ලාභය		**48,499,963**	**65,950,511**
	අනෙකුත් ආදායම්		-	-
	බදු වලින් නිලව් කිරීමට එකඟ වී ඇති වියදම්		8,296,234	8,022,477
	බදු වලින් අඩු කිරීමට හැකි වියදම්		(2,630,934)	(651,652)
	ව්‍යාපාරයෙන් උපයන ලද පොලිය මත ලාභය		**54,165,263**	**73,321,337**
	මුළු බදු ආදායම		**54,165,263**	**73,321,337**
	ආදායම් බදු වියදම් 18%		9,749,747	13,197,841
			9,749,747	**13,197,841**
11	**ණය සහ අත්තිකාරම්**			
	රාජ්‍ය ආයතන වල සේවකයන් සඳහා ණය	**11.1**	206,682,105	332,481,497
	කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්	**11.2**	10,546,736	9,662,778
			217,228,841	**342,144,275**
11.1	**රාජ්‍ය ආයතන වල සේවකයන් සඳහා ණය**			
	රාජ්‍ය සේවකයින්/ රාජ්‍ය සංස්ථා සඳහා ණය			
	ක්‍රියාකාරී ණය		194,546,806	322,992,299
	ක්‍රියාකාරී නොවන ණය		15,694,182	11,117,299
			210,240,988	**334,109,598**
	ක්‍රියාකාරි නොවන - ණය සඳහා විලම්බන පොලිය		(3,505,818)	(1,208,510)
	ණය අලාභ ප්‍රතිපාදන		(53,064)	(419,591)
			206,682,105	**332,481,497**
11.2	**කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්**			
	කාර්ය මණ්ඩල ණය - දස මස්		5,788,016	5,895,608
	කාර්ය මණ්ඩල ණය - 11.5%		2,404,341	3,321,475
	කාර්ය මණ්ඩල ණය - ටැබ් ණය (4.5%)		2,115,759	-
	කාර්ය මණ්ඩල ණය - 11.5%		230,620	434,634
	පාපැදි ණය		8,000	8,000
	උත්සව අත්තිකාරම්		-	3,061
			10,546,736	**9,662,778**

			31/12/2021	31/12/2020
			රු.	රු.
12	**අනෙකුත් වත්කම්**			
	ස්ථාවර තැම්පතු මත පොලිය		4,475,419	3,165,055
	ලැබිය යුතු ගොඩනැගිලි කුලි		2,139,576	1,836,925
	ලැබිය යුතු ගොඩනැගිලි කුලි තැන්පතු		347,676	390,000
			6,962,671	**5,391,980**
13	**<u>ස්ථාවර තැම්පතු මත ආයෝජන</u>**			
	ස්ථාවර තැම්පතු		425,295,334	253,659,297
			425,295,334	**253,659,297**
14	**මුදල් හා කෙටි කාලීන අරමුදල්**			
	මහජන බැංකුව - 204100 1600 85389		8,803,638	12,942,777
	මහජන බැංකුව - 204100 1800 85388		1,431,365	2,072,770
	මහජන බැංකුව - 204100 2500 85389		1,541,963	1,021,692
	අතැනි මුදල්		20,000	20,000
			11,796,966	**16,057,239**
15	**විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන**			
	වසර ආරම්භයේ ශේෂය		20,846,540	17,295,208
	වසර සඳහා වූ ප්‍රතිපාදන		3,782,405	3,602,716
	වසර තුල දී ගෙවීම්		(1,932,900)	-
	වසර අවසාන ශේෂය		**22,696,045**	**20,846,540**
16	**අනෙකුත් වගකීම්**			
	ගොඩනැගිලි කුලි තැම්පතු	**16.1**	9,020,571	8,573,895
	රාජ්‍ය සේවකයන් සඳහා ලබාදුන් ණය මුදල් වැඩිපුර අයකර ගැනීම		4,356,708	4,705,705
	උපචිත වියදම්	**16.2**	1,253,669	1,436,264
	ණය හිමියන්		342,046	315,328
	අනෙකුත් තැම්පතු - ආරක්ෂක		100,000	100,000
	නැවත ගෙවිය යුතු තැන්පතු		20,000	-
			15,092,994	**15,131,192**

		31/12/2021	31/12/2020
		රු.	රු.
16.1	**ගොඩනැගිලි කුලි තැම්පත්**		
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	3,540,000	3,540,000
	ලංකා විදුලිබල මණ්ඩලය	2,400,000	2,400,000
	ලංකා විදුලිබල මණ්ඩලය - (තොරතුරු තාක්ෂණ අංශය)	1,631,571	1,402,500
	සමුපකාර සේවක කොමිෂන් සභාව	1,350,000	1,231,395
	MAA ඇසෝසියේටස්	99,000	-
		9,020,571	**8,573,895**
16.2	**ගෙවිය යුතු වියදම්**		
	නඩත්තු - ගොඩනැගිලි	347,906	347,906
	උපදේශන ගාස්තු	229,379	-
	විගණන ගාස්තු	155,000	75,000
	ආරක්ෂක ගාස්තු	153,280	152,180
	මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	146,139	125,357
	විදුලිය	92,040	73,269
	වාර්ෂික ප්‍රසාද දීමනා	40,313	77,188
	දුරකථන	33,581	33,835
	ගෙවිය යුතු බදු ගොනු කිරීමේ ගාස්තුව	25,000	-
	මුද්දර ගාස්තු	14,825	17,875
	ජලය	7,737	7,872
	පාලන භාරකාර	6,201	10,054
	වැටුප්	2,270	-
	නීති ගාස්තු	-	354,050
	ගොඩැනැගිලි රක්ෂණය	-	74,618
	පරිගණක නඩත්තු	-	62,560
	අතිකාල	-	18,501
	විශේෂ දීමනා	-	6,000
		1,253,669	**1,436,265**
17	**බදුකරණය සඳහා ප්‍රතිපාදන**		
	වසර ආරම්භයේ දී ශේෂය	6,157,888	7,284,797
	වසර සඳහා වූ ප්‍රතිපාදන	9,749,747	13,197,841
	බදු ගෙවීම්	(10,403,160)	(14,324,749)
	රඳවා ගැනීමේ බදු	-	-
	වසර අවසාන ශේෂය	**5,504,476**	**6,157,888**

18	දේපළ පිරියත හා උපකරණ පිරිවැය	2021.01.01 දිනට ශේෂය රු.	වසර තුල දී ගැලපීම් රු.	වසර තුල දී ඉවත් කිරීම් රු.	2021.12.31 දිනට ශේෂය රු.
	සින්නක්කරය				
	ගොඩනැගිලි	10,400,000	-	-	10,400,000
	මෝටර් රථ	16,008,750	-	-	16,008,750
	විදුලි උපකරණ හා සිහුම් (සවිකිරීම්)	3,686,429	-	8,990	3,677,439
	පරිගණක උපකරණ	5,888,810	31,000	5,040	5,914,770
	ගෘහ භාණ්ඩ හා සවි කිරීම	1,437,268	6,900	-	1,444,168
	කාර්යාල උපකරණ	2,047,612	269,187	26,229	2,290,570
	බදු ඉඩම්	98,000,000	-	-	98,000,000
		137,468,869	**307,087**	**40,259**	**137,735,697**

	සමුච්චිත ක්ෂය	2021.01.01 දිනට ශේෂය රු.	වර්ෂය සඳහා ගාස්තු රු.	වසර තුල දී ඉවත් කිරීම් රු.	2021.12.31 දිනට ශේෂය රු.
	සින්නක්කර				
	ගොඩනැගිලි	8,171,426	247,619	-	8,419,045
	මෝටර් රථ	15,948,156	17,188	-	15,965,344
	විදුලි උපකරණ හා සිහුම් (සවිකිරීම්)	3,440,071	47,152	5,342	3,481,881
	පරිගණක උපකරණ	3,594,013	592,424	5,040	4,181,397
	ගෘහ භාණ්ඩ හා සවි කිරීම	883,026	111,806	-	994,832
	කාර්යාල උපකරණ	1,285,523	127,610	16,954	1,396,179
	බදු ඉඩම්	21,000,000	2,333,333	-	23,333,333
		54,322,215	**3,477,132**	**27,337**	**57,772,010**
	ලියාහල අගය	83,146,654			**79,963,687**

19	ආයෝජන දේපළ පිරිවැය/ තක්සේරුව	2021.01.01 දිනට ශේෂය රු.	වසර තුල දී ගැලපීම් රු.	2021.12.31 දිනට ශේෂය රු.
	ආයෝජන දේපළ	41,600,000	-	**41,600,000**
		41,600,000	-	**41,600,000**

	සමුච්චිත ක්ෂයවීම	2021.01.01 දිනට ශේෂය රු.	වර්ෂය සඳහා ගාස්තු රු.	2021.12.31 දිනට ශේෂය රු.
	ආයෝජන දේපළ	**15,352,383**	990,477	**16,342,860**
		15,352,383	990,477	**16,342,860**
	ලියාහල අගය	**26,247,617**		**25,257,140**